17

# ගුප්ත යුගයේ බුද්ධ ප්‍රතිමාවල රූපභේද

*ආර්. එම්. යූ. එස්. රාජපක්ෂ* [1]
HU/2012/0576

ක්‍රි.ව. 3 වන සියවසේ සිට 6 වන සියවස දක්වා වූ කාල පරිච්ඡේදයේ භාරතයේ ස්වර්ණමය යුගයක් පිළිබිඹු කරමින් නිර්මාණය වූ ගුප්ත බුද්ධ ප්‍රතිමාවෙහි දක්නට ලැබෙන රූපභේද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම මෙම පර්යේෂණයෙන් අරමුණු කෙරේ. ගුප්ත අධිරාජ්‍ය සමයේ නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමා බුදුන් වහන්සේගේ ප්‍රතිරූපය හැකි තරම් නිවැරදි ආකාරයටත් මිනිස් සිරුරේ නියම පරිමාණ ලක්ෂණත් අනුගමනය කරමින් නිර්මාණය වූ ඒවාය. මෙලෙස නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමා ප්‍රධාන වශයෙන් සාරානාත් සහ මථුරා ගුරු කුල කේන්ද්‍ර කරගනිමින් වෙනස් රූපභේදයන්ගෙන් යුක්තව නිර්මාණය විය. මෙහිදී මථුරා කලා සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමාවෙහි චීවරය රැළි සහිත ව සහ සාරානාත් කලා සම්ප්‍රදායේ දී චීවරය රැළි රහිත ව නිර්මාණය විය. ගුප්ත බුද්ධ ප්‍රතිමාව හිඳි සහ හිටි බුද්ධ ප්‍රතිමා ලෙස ඉරියව් අනුව වර්ගීකරණය කළ හැකි ය. හිඳි බුද්ධ ප්‍රතිමා සඳහා බෙහෙවින් සමාධි, ධර්ම චක්‍ර මුද්‍රාව, අභය මුද්‍රාව (ජාලාංගුලිකාකාර මුද්‍රාව) යොදා ගන්නා ලදී. හිටි බුද්ධ ප්‍රතිමා සඳහා අභය මුද්‍රා සහ වරද මුද්‍රා ජනප්‍රියව පැවතිනි. හිටි බුද්ධ ප්‍රතිමා සමභංග, ද්විභංග, ත්‍රිභංග සහ ඡත්‍ර සහිත ප්‍රතිමා ලෙස නිර්මාණය විය. බුද්ධ ප්‍රතිමා සඳහා පද්මාසනය සහ සිංහාසනය ජනප්‍රියව පැවතිණි. හිටි ප්‍රතිමා මෙන්ම වැඩ සිටින ප්‍රතිමා සඳහා ද ප්‍රභා මණ්ඩලයක් වූ අතර ඇතැම් හිටි බුද්ධ ප්‍රතිමාවන්හි සිරුර වටාම ප්‍රභා මණ්ඩලයක් නිර්මාණය විය. හිඳි සහ හිටි බුද්ධ ප්‍රතිමාවන්ට අමතරව ගුප්ත රූපභේදයන්ට අනුකූලව නිර්මාණය වූ ශීර්ෂ මූර්ති ද හමු වේ. ගුප්ත බුද්ධ ප්‍රතිමා පිළිබඳ දත්ත රැස් කිරීමේදී ඉන්දීය බුද්ධ ප්‍රතිමා කලාව හා සම්බන්ධ ග්‍රන්ථයන් ද්විතියීක මූලාශ්‍රයන් ලෙසත් වාර සඟරා සහ අන්තර්ජාලය තෘතීයික මූලාශ්‍රයන් ලෙසත් උපයෝගී කර ගැනිණි. මෙසේ රැස් කළ දත්ත ඇසුරෙන්, ගුප්ත බුද්ධ ප්‍රතිමා ශිල්පියා ප්‍රතිමාවෙහි බාහිර සුන්දරත්වය පමණක් නොව අභ්‍යන්තර ගුණාංගයන් වන කරුණාව, ශාන්ත භාවය ඉස්මතු කිරීම උදෙසා ද රූපභේද උපයෝගී කර ගත් බවත්, අවස්ථානුකූලව ඒ ඒ රූපභේද භාවිතයට ගනිමින් ප්‍රතිමාවෙහි ඒකාබද්ධතාව රැක ගැනීමට සමත් වූ බවත් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ බුද්ධ ප්‍රතිමා, ගුප්ත කලාව, හිඳි ප්‍රතිමා, හිටි ප්‍රතිමා, රූපභේද

---

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණ (විශේෂවේදී) දෙවැනි වසර*